උඩුදුම්බර ප්‍රාදේශීය සභාව - 2020
---------------------------------------

**1.** මූල්‍ය ප්‍රකාශන
-------------------

**1.1** තත්ත්වාගණනය කළ මතය
--------------------------------

උඩුදුම්බර ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට උඩුදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
--------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනයකරන පාර්ශවයන්ගේ වගකීම්
------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1** **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයේ සඳහන් පර්චස් 72 ක ඉඩම් 05 ක් සහ ඉඩමේ ප්‍රමාණය ගණනය නොකල ඉඩම් 03 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී තක්සේරු කර වටිනාකම් ගිණුම් ගත කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ආ) | හුන්නස්ගිරිය ආදාහනාගාරය භූමිය වටා වැට ඉදිකිරීමේ පළමු අදියර වෙනුවෙන් වැය කර තිබූ රු.442,233 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2021 අවසන් ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |

**1.6.2** **නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.7,342,774 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාළ ශේෂයන්හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.1,681,880 ක වෙනසක් විය. | 2021 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |

### 1.6.3 අසම්භාව්‍ය බැරකම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව විසින් කඩ කාමර සම්බන්ධයෙන් වෙනත් පාර්ශවයන්ට එරෙහිව පවරා තිබුණු නඩු 5 ක් හා බාහිර පාර්ශවකරුවන් 6 දෙනෙකු විසින් සභාවට එරෙහිව පැවරූ නඩු 6 ක් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී අදාළ තොරතුරු ගිණුම්වල ඇතුළත් කිරිමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන පරිහරණය කරන්නන්ට තීරණ ගැනීමට අවශ්‍ය සියලු තොරතුරු හෙළිදරව් කළ යුතු වීම. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය | සභාවේ සභිකයන් සඳහා හඳුනාගැනීමේ කාඩ්පත් මුද්‍රණයට පනත ප්‍රකාරව සභා අරමුදල යෙදවිය නොහැකි වුවත් රු.37,800 ක මුදලක් ඒ සඳහා වැයකර තිබුණි. | හදුනාගැනීමේ කාඩ්පත් මුද්‍රණය කරන ලද්දේ පළාත් පාලන කොමසාරිස්ගේ 2018 අගෝස්තු 13 දිනැති අංක සිපීසී/සීඑල්ජී/1/5/3-4 (2018) දරන ලිපියෙන් ලිපි ශීර්ෂ මුද්‍රණය කිරීම සම්බන්ධව ලබා දී ඇති උපදෙස් අනුව බවයි. | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2012 ජනවාරි 05 දිනැති අංක 1/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සංවර්ධන ව්‍යාපෘති 10 ක් ඉටු කිරීම සඳහා රු.13,085,198 කට ගිවිසුම් අත්සන් කළ සමිති විසින් කොන්ත්‍රාත් ඉටු නොකර වෙනත් පාර්ශව වෙත උප කොන්ත්‍රාත් ලබා දී තිබුණි. | මෙ සම්බන්ධයෙන් අදාළ සමිති මගින් වාචිකව විමසීම් කිරීමේදී, ප්‍රාදේශීය සභාව සමග ගිවිසුම්ගත වීමේදී, බැංකු වාර්තාවල එම මුදල පැවතියත්, ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය, උපකරණ සහ කම්කරු ශ්‍රමය,ණය පදනම මත හෝ පසුව ගෙවීමේ පදනම මත ලබා ගෙන ගෙවීම් සිදු කරයි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,961,982 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,263,389 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් | | |
| | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති රු.205,784 ක් වූ හිඟ ශේෂයෙන් වර්ෂය තුළදී රු.56,510ක් හෙවත් සියයට 27 ක්පමණක් අයකරගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.388,414 ක් වූ හිඟ ශේෂය තුළ වසර5 ට වැඩි රු.35,418 ක් ඇතුළත්ව තිබුණි. | 2021 මැයි 20 දින වන විට රු.67,476 ක මුදලක් අයකර ගන්නා ලද අතර සෞඛ්‍යය තත්වය යහපත් තත්වයට පත් වූ පසු ජංගම සේවා පවත්වා අදාළ හිඟ මුදල අයකරගැනීමට කටයුතු කරමි. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | අක්කර බදු | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයටරු.121,281 ක් වූ හිඟ ශේෂයෙන් වර්ෂය තුළදීරු.6,997 ක් හෙවත් සියයට 6 ක් පමණක් අයකරගෙන තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.122,852 ක ශේෂය තුළ වර්ෂ 5 ඉක්මවූ රු.83,643 ක ශේෂ ඇතුළත් විය. | හිඟ මුදල ගෙවීමට කටයුතු කරන ලෙස අදාළ පාර්ශවය දුරකථන මාර්ගයෙන් හා ලිපි මාර්ගයෙන් දැනුවත් කර ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වතු අධිකාරිය සතු වතු 04 කින් අයවිය යුතු රු.119,758 ක බදු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල ගෙවීමට කටයුතු කරන ලෙස අදාළ පාර්ශවය දුරකථන මාර්ගයෙන් හා ලිපි මාර්ගයෙන් දැනුවත් කර ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | වෙනත් ආදායම් | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි කුලී රථ හා ත්‍රී රෝද රථ ගාස්තු ශේෂය රු.343,600 ක් වූ අතර, කුලී රථ වාහන නවතා තැබීමේ බලපත්‍ර වලින් අයවිය යුතු හිඟ මුදල රු.124,200 ක් විය. | අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කරමි. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.841,930 ක හිඟජල ගාස්තු ශේෂයෙන් වර්ෂය තුළදී රු.496,687 ක්හෙවත් සියයට 58 ක් පමණක් අය කරගෙන තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.813,833 ක් වූ ශේෂය තුළ වර්ෂ 1 ත් 5 ත් අතර කාලයක් ඉක්මවූ රු.186,906 ක් සහ වර්ෂ 5 ක් ඉක්මවූ රු.147,895 ක් වූ ශේෂ ඇතුළත්ව තිබුණි. | 2021 මැයි 21 වන විට රු.240,840 මුදලක් අයකර ගෙන ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |

(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් හා අනෙකුත් ආයතනවලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.698,495 ක් හා මුද්දර ගාස්තු රු.5,985,184 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි මුදල් ගෙන්වා ගැනීම සඳහා ඉදිරි කටයුතු කරමි. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 11 ක එකතු වටිනාකම රු.20,726,751 ක් වූ අතර, එයින් වර්ෂ 1-5 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.11,086,939 ද වර්ෂ 05 කට වැඩි කාලයක් ඉක්මවූ රු.1,764,033 ක ශේෂයක්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම අයවිය යුතු මුදල් අයකිරීම සඳහා අදාළ පාර්ශවයන් දැනුවත් කර ඇත. | නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයහිමියන් සඳහා රු.8,361,588 ක් හා විවිධ ණයහිමියන් සඳහා රු.671,952 ක් ලෙස එකතුව රු.9,033,538 ක් ගෙවිය යුතුව තිබුණි. | ගෙවිය යුතු ගිණුම් වලින් 2021 මැයි 21 දිනට ඉතිරිව ඇත්තේ රු.9,033,538 ක මුදලක් වන අතර, එම මුදල ගෙවීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. | නොපමාව නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොම්පෝස්ට් අගල හා ගබඩාව සඳහා 2010 වර්ෂයේදී රු.3,487,828 ක මුදලක්ද, 2019 වර්ෂයේදී කොම්පෝස්ට් අගලේ වහලය උස් කිරීමට රු.385,000 ක්ද, පොහොර වියළීමේ මධ්‍යස්ථානයට රු.1,167,606 ක මුදලක් ද යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමට 2012 - 2017 කාලසීමාවේදී රු.5,069,140 ක මුදලක්ද වැයකර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ කොම්පෝස්ට් පොහොර ටොන් 5.5 ක් පමණක් නිෂ්පාදනය කර රු.40,600 ක් පමණක් උපයාගෙන තිබුණි. | ප්‍රමාණවත් පරිදි සනීපාරක්ෂක සේවකයින් නොසිටීම හේතුවෙන් ව්‍යාපෘති කටයුතු විධිමත්ව කර ගැනීමට අපහසුව ඇත. | ව්‍යාපෘතිය සඳහා වැය කර ඇති මුදලින් උපරිම ඵලදායීත්වයක් ලබාගත හැකි පරිදි සැලැසුම් සකස් කළ යුතු වීම. |
| (ආ) | කුලී | | |
| | සභාව සතු කඩ කාමර 19 ක මාසික කුලිය 2018 මැයි 22 දින තක්සේරු කර ඇතත්, එම තක්සේරුව ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් අයකර ගත යුතු රු.1,656,640 ක මුදලක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | කඩ කාමර 05 ක් නව තක්සේරුව අනුව මුදල් ගෙවීමට අකමැති වූ බැවින් සභාව මගින් නඩු මාර්ගයකට එළඹ ඇති අතර, ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා ලිපි මගින් දැනුවත් කර ඇත. කඩ කාමර මුද්‍රා තැබීම සඳහාද කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමි. | නව තක්සේරුව අනුව කඩ කුලී අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතු වීම. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ධාවන තත්ත්වයේ පවතින 2015 වර්ෂයේ සිට සභාවට පවරා ඇති රු.17,649,179 ක් වටිනා බැකෝලෝඩර් රථය හා රු.7,967,144 ක් වටිනා සිංගල් වයිබ්‍රේටින් ලෝඩරය ඉකුත් වර්ෂයේ සිට භාවිතයට ගෙන නොතිබුණි. | යන්ත්‍ර ක්‍රියා කරුවන් සඳහා රියදුරෙකු නොමැති බැවින් ආදායම් උත්පාදනයට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇත. | සභාව සතු වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වීම. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මඩුගල්ල දකුණ නළලිං ව්‍යාපෘතියේ පස් කැපීම, බට වැළලීම හා වැසීම ප්‍රදේශයේ ජනතාවගේ ශ්‍රම දායකත්වයෙන් සිදුකර තිබුණද බිල්පත්‍රයේ අයිතම අංක 19 මඟින් පස් කපා pvc බට අතුරා වැසීම සඳහා රු.180,830 ක් ගෙවා තිබුණි. | බිල්පත ගෙවීමෙන් අනතුරුව සේවය කරන ලද සේවකයන්ට මුදල් ගෙවූ බව අදාළ සමිතියෙන් විමසීමේ දී ප්‍රකාශ කර ඇත. | ඇස්තමේන්තු ගත කරන ලද වැඩ කොටස් මැන, පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව තාක්ෂණික නිලධාරියෙකුගේ නිර්දේශ මත ගෙවීම් කළ යුතු වීම. |
| (ආ) | දීගල්ල වැව සංවර්ධනය සඳහා වූ ඇස්තමේන්තුවේ අයිතම අංක 02 මඟින් ඝනමීටර 935.85 ක පස් ඉවත් කිරීම වශයෙන් දක්වා රු.304,435 ක මුදලක් ගෙවීම් කර තිබුඅතර භෞතික පරීක්ෂාවේදී වැවේ සොරොව්වේ පතුලෙන් පහළට පස් ඉවත් කිරීම සිදුකර නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දුන් පරිදි නැවත වතාවක් මිනුම් පරීක්ෂා කළ අතර එහි දී මිනුම් සටහන් කිරීමේ දෝෂයක් පවති. | ඇස්තමේන්තු ගත කරන ලද වැඩ කොටස් මැන, පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව තාක්ෂණික නිලධාරියෙකුගේ නිර්දේශ මත ගෙවීම් කළ යුතු වීම. |